**බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය**

**පළමු වාර පරීක්ෂණය** **07 ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය 1-2** **පැය දෙකයි**

**01 කොටස**

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පහත සඳහන් ප්‍රස්ථාව පිරුළු සම්පූර්ණ කරන්න.

01. වඳුරාට ……………….. වගෙයි.

02. අඹ කෑ මිනිහගේ……………. වගෙයි.

වරහනට පිටින් දී ඇති වචනය වෙනුවට යෙදිය හැකි වචන තුනක් වරහන තුල ඇත. නොගැලපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

03. ඇස (අක්ෂි, සවන, නුවණ, නේත්‍ර)

04. පොළොව (භූමිය, දෙරණ, මිහිකත, ගුවන)

05. නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන

i. 18
ii. 60
iii. 42
iv. 54

පහත වාක්‍යවල ඇති රූඪිවලට යටින් ඉරක් අඳින්න.

06. අම්මා දොස් පැවරූ විට නිමල්ගේ මූණ ඇඹුල් විය.

07. තරිඳු සිකුරට ම විභාගය සමත්වන බව මව දැන සිටියාය.

නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

08. ශිෂ්ඨාචාරය, ශිෂ්ටාචාරය, ශිස්ටාචාරය

09. ප්‍රස්තාර, ප්‍රස්ථාර, ප්‍රශ්තාර

10. පහත සඳහන් පුරුෂවාචී නාමපද වල ස්ත්‍රී වාචී නාම පද ලියන්න.

i. අශ්වයා ………………
ii. අලියා ………………..

11. සිංහල අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර යෙදුණු වචන දෙකක් ලියන්න.

i. ……………………..
ii. ……………………..

12. ශ්‍රී ලංකාවේ අභිකුණ්ඩික ජනයා භාවිතා කළ පහත් උපකරණ වල තේරුම ලියන්න.

i. මස්කත් …………………..

ii. ඉරමන් …………….

13. කමත් භාෂාවේ පහත සඳහන් යෙදුම් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පද ලියන්න.

i. පැඟිරිබෝය ...............

ii. කිරි කබලු ………………

පහත සඳහන් පදවල අනුක්ත පද ලියන්න

14. ළමයි ……………………………

15. මනාලියක් ………………

16. මධ්‍යම පුරුෂයට අයත් නම පද දෙකක් කොටුව තුළින් තෝරා ලියන්න.

| |
|---|
| නුඹ, ඇය, මම, තොපි, ළමයි ,කුරුල්ලා |

i. ………………….
ii. ………………….

පහත වාක්‍යවල ඉරි ඇඳි පද කවර ක්‍රියා පද වර්ගයකට අයත් දැයි තෝරා ඉරක් අඳින්න.

17. මම පොත් පාඩම් කර නින්දට ගියෙමි.

i. මිශ්‍ර ක්‍රියා
ii. පූර්ව ක්‍රියා
iii. ප්‍රයෝජ්‍ය ක්‍රියා
iv. විධි ක්‍රියා

18. ගොවියෝ ගොයම් කපමින් කවි කියති.

i. මිශ්‍ර ක්‍රියා
ii. පූර්ව ක්‍රියා
iii. ප්‍රයෝජ්‍ය ක්‍රියා
iv. විධි ක්‍රියා

උක්ත ආඛ්‍යාත පද නිවැරදිව යෙදීමට අවශ්‍ය පදය වරහන් තුළින් තෝරා ඉරක් අඳින්න.

19. තාරකා ආකාසේ ............. (බබළති/ බබළයි)

20. ගුරුවරු අපට යහමග යන්නට ඔවදන් ............(දෙයි /දෙති)

(ලකුණු 2 x 20=40)

## 2 කොටස

පළමුවන ප්‍රශ්නය දෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. සිංහල විෂය සඳහා ඔබ නිර්මාණය කළ පොත් පිංචක් ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පොත් පිංච සකස් කළේ කුමන මාතෘකාවක් යටතේ ද? (ලකුණු 02)
ii. ඔබ ඒ සඳහා යොදා ගත් සම්පත් මොනවාද? (ලකුණු 02)
iii. ඔබ ඒ සඳහා උපදෙස් ලබාගත් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)
iv. මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු හතරක් ලියන්න. (ලකුණු 04)
v. පොත් පිංච නිර්මාණය කිරීමේදී ඔබ ලබාගත් ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(ලකුණු 15)

02. දී ඇති මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන වචන 150 ට නොඅඩු නිර්මාණාත්මක රචනයක් ලියන්න.

i. සුන්දර ශ්‍රී ලංකා
ii. පරිසරය සුරකිමු
iii. අතිපූජ්‍ය වැලිවිට සරණංකර සංඝරජ තෙරණුවෝ
iv. මගේ අනාගත බලාපොරොත්තු
v. බස රසවත් කරන ප්‍රස්තාව පිරුළු

(ලකුණු 15)

03. පහත දී ඇති ක්‍රියා පද යොදාගෙන අදාල වගුව සම්පූර්ණ කරන්න.

( නට නටා , නෙළයි, දුවමින්, යයි, පනිමින්, නැටුවාය,බලා, අඬමින්, කියවා, ලියමින්, ගයයි, කපා, නිදාගනී, ගයමින්,බැලුවේය, හඬ හඬා, අඬා, පැන)

| මිශ්‍ර ක්‍රියා | පූර්ව ක්‍රියා | අවසාන ක්‍රියා |
|---|---|---|
| | | |

(ලකුණු 10)

04. ඔබ පාසලේ පැවැති වාර්ෂික විවිධ ප්‍රසංගයේ තොරතුරු සඳහන් කරමින් වෙනත් පාසලකට ගිය ඔබේ හොඳම මිතුරා හෝ මිතුරිය වෙත යැවෙන ලිපිය ලියන්න.

(ලකුණු 10)

05. පාසල් භූමියේ තම පන්තියට අදාළ කොටස පිරිසිදු කිරීම හා අලංකාර කිරීම නිසි ලෙස පවත්වාගෙන යාමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සිසුන් සමග ඇති වන කෙටි සංවාදයක් ගොඩනඟන්න.

(ලකුණු 10)

06. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

ගුත්තිල කාව්‍යය රචනා කරනු ලැබුවේ කෝට්ටේ යුගයේ වැඩ විසූ වෑත්තෑවේ හිමියන් විසිනි. උන්වහන්සේ වයඹ පළාතේ සත් කෝරලයේ පහළ දොළොස් පත්තුවේ වෑත්තෑව නම් ගමෙහි උපන්නෙකි. පද්‍ය 511 කින් සමන්විත ගුත්තිල කාව්‍යය ගුත්තිල ජාතකය ඇසුරින් නිර්මාණය වූවකි. ගුත්තිල කාව්‍යය රචනා කරන ලෙස ආරාධනය කරනු ලැබුවේ සිරි පැරකුම්බා රජුට සේවය කළ අගමැතිවරයෙකු වූ සලාවත ජයපාල මැතිඳුන් විසිනි. වෑත්තෑවේ හිමි තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ගෝලයෙක් විය.

i. ගුත්තිල කාව්‍යය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?
ii. ගුත්තිල කාව්‍යය රචනා වූයේ කිනම් යුගයකද?
iii. ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය ගණන කීයද?
iv. ගුත්තිල කාව්‍යය කිනම් ජාතක කතාවක් ඇසුරින් නිර්මාණය වූවක්ද?
v. ගුත්තිල කාව්‍යය රචනා කළ හිමිනමගේ ගුරුවරයා කවුද?

(ලකුණු 10)

**සිංහල භාෂාව හා සාහිත්‍යය**
07 ශ්‍රේණිය

**පිළිතුරු පත්‍රය**

01. දැලිපිහිය

02. මොළේ

03. සවන

04. ශුවන

05. 60

06. මුහුණ ඇඹුල් විය.

07. සිකුරට ම

08. ශිෂ්ටාචාරය

09.ප්‍රස්තාර

10. වෙළඹ / කෙනෙර

11. මහාප්‍රාණ අක්ෂර යෙදුනු වචන දෙකක්

12. පිහිය/ හිරමනය

13. බුලත් විට / ආප්ප

14. ළමයින්

15. මනාලියක

16. නුඹ / තොපි

17. පූර්ව ක්‍රියා

18. මිශ්‍ර ක්‍රියා

19. බබළයි

20. දෙති

එච්.එම්.ජයමාලි කුමාරි
ර/බල/ඌරාවල විද්‍යාලය
කොට්ටිඹුල්වල